**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாணக் கலவித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

අවසාන වාර පරීක්ෂණය 2020 | 12 ශ්‍රේණිය
முன்றாம் தவணைப் பரீட்சை 2020 | தரம் 12
**Final Term Test - 2020** | **Grade 12**

ඉන්දියන් ඉතිහාසය I
இந்தியா வரலாறு I
**Indiyan History I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
**Three hour**

**ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

**උපදෙස්**
- මෙම කොටසේ ප්‍රශ්න **40** ඇත. **සියලුම** ප්‍රශ්න වලට **මෙම ප්‍රශ්න පත්‍රයේම** පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහ බැගින් දී ඇති නමුදු නිවැරදි වන්නේ එකක් පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- කොටස් දෙකටම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු I කොටස II කොටසේ පිළිතුරුපත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- **අංක 01 සිට 10 තෙක් වූ ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නො ගැළපේ. එම නො ගැළපෙන නම කුමක්දැයි හඳුනා ගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.**

01. (1) කිර්තාර් (2) සුලෙයිමාන් (3) වින්ධ්‍යා
(4) කාරකෝරම් (5) හින්දුකුෂ් (..........)

02. (1) බ්‍රහ්මපුත්‍ර (2) මහානදී (3) චම්බාල්
(4) යමුනා (5) ගෝමතී (..........)

03. (1) බ්‍රහ්මගිරි (2) මස්කි (3) ධෞලි
(4) අයිහෝලේ (5) කයිරාට් (..........)

04. (1) වජ්ජි (2) මගධ (3) වත්ස
(4) කෝසල (5) අවන්ති (..........)

05. (1) ඒරියා (2) ඇරකෝෂියා (3) ආන්ද්‍රා
(4) පරොපනිසඳයි (5) ගෙඩ්‍රෝසියා (..........)

06. (1) ආර්.ඩී. බැනර්ජි (2) මෝර්ටිමර් විලර් (3) ස්ටුවර්ට් පිගොට්
(4) ජෝන් මාර්ෂල් (5) ජේම්ස් ප්‍රින්සෙප් (..........)

07. (1) ඉන්ද්‍රප්‍රස්ථ (2) පුරුෂපුර (3) කොෂම්බි
(4) වෛශාලි (5) පාටලීපුත්‍ර (..........)

08. (1) මත්ස්‍ය පුරාණ (2) විෂ්ණු පුරාණ (3) වායු පුරාණ
(4) පෙරිය පුරාණම් (5) ස්කන්ධ පුරාණ (..........)

09. (1) බැරෝඩා (2) බෝලාන් (3) හේරාත්
(4) ඛයිබර් (5) මක්‍රාන් (..........)

10. (1) වාතාපිකොණ්ඩ (2) වික්‍රමාදිත්‍ය (3) කවිරාජ
(4) මහා රාජාධිරාජ (5) පරම භගවත (..........)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක් දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

11. (1) ව්‍යාකරණ - මහාභාෂ්‍ය
    (2) වංශකථා - රාජතරංගිණී
    (3) වෛද්‍ය - අෂ්ටාංග සංග්‍රහ
    (4) තාරකා ශාස්ත්‍රය - සූශෘතසංහිතා
    (5) නාට්‍ය - රත්නාවලී (..........)

12. (1) මගධය - රාජගෘහ
    (2) අවන්ති - උජ්ජේනි
    (3) කෝසල - ශ්‍රාවස්ති
    (4) කාම්බෝජ - තක්ෂිලා
    (5) වත්ස - කෞසම්බි (..........)

13. (1) පසේනදී කෝසල - මල්ලිකා
    (2) අශෝක - මුරා
    (3) සමුද්‍රගුප්ත - දත්තදේවි
    (4) දෙවන චන්ද්‍රගුප්ත - කුවේරනාගා
    (5) ග්‍රහවර්මන් - රාජ්‍ය ශ්‍රී (..........)

14. (1) අංග - චම්පා
    (2) වත්ස - කෞශම්බි
    (3) කුරු - කාම්පිල්‍ය
    (4) කාසි - බාරනාසි
    (5) සූරසේන - මථුරා (..........)

15. (1) සාංචි - ස්තූප
    (2) මහාබලිපුරම් - පල්ලවරථ
    (3) මථුරා - ලෙන්චිත්‍ර
    (4) අජන්තා - ලෙන්විහාර
    (5) ගංගෙයි කොන්ඩ - හින්දු දේවාල (..........)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/ දින වකවානු සමූහයක් X හා Y තීරුවේ දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ ඇති නාම / ප්‍රකාශන දින වකවානු සමඟ කිසියම් ආකාරයකින් ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලකට නොවේ. Y තීරුවේ X තීරුවේ සමග ගැළපෙන අනුපිළිවෙළකට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| (i) | නගරශ්‍රේෂ්ඨ | A | ප්‍රධාන අයකැමි |
| (ii) | මහාදණ්ඩනායක | B | නගර ශ්‍රේණි නායක |
| (iii) | සන්ධිවිග්‍රාහික | C | සාමය හා යුද්ධය පිළිබඳ ඇමති |
| (iv) | සමාහර්ත | D | හමුදාපති |
| (v) | අන්තර්වාශික | E | අන්තඃපුර පාලක |

(1) BAEDC (2) BEDCA (3) BDCAE (4) BCAED (5) BDEAC (..........)

17. (i) කාවේරි — A ඩෙකාන් සානුව
(ii) බ්‍රහ්මපුත්‍ර — B මයිසූර් සානුව
(iii) සින්දු — C වින්ධ්‍යා -සත්පුර කඳුවැටි
(iv) නර්මදා — D හිමාලයා කඳු වැටිය
(v) ගෝධාවරී — E ටිබෙට් සානුව

(1) BAEDC (2) BEDCA (3) BDCAE (4) BCAED (5) BDEAC (..........)

18. (i) තිරුමුලර් — A කාමසූත්‍ර
(ii) කෞටිල්‍ය — B තිරුමන්දිරම්
(iii) වාත්ස්‍යායන — C අර්ථශාස්ත්‍ර
(iv) භාරවී — D නාගානන්ද
(v) හර්ෂවර්ධන — E කිරාතාර්ජුනිය

(1) BAEDC (2) BEDCA (3) BDCAE (4) BCAED (5) BDEAC (..........)

19. (i) ක්‍රි.පූ. 273-232 — A I රාජරාජ
(ii) ක්‍රි.ව. 78-101 — B හර්ෂ
(iii) ක්‍රි.ව. 335-376 — C අශෝක
(iv) ක්‍රි.ව. 606-648 — D කණිෂ්ක
(v) ක්‍රි.ව. 985-1014 — E සමුද්‍රගුප්ත

(1) CABDE (2) CBAED (3) CDEBA (4) CEABD (5) CAEBD (..........)

20. (i) මහාරක්ෂිත — A යවනදේශය
(ii) මජ්ඣිම — B මහාරට්ඨ
(iii) රක්ෂිත — C හිමවන්ත
(iv) මහාධර්මරක්ෂිත — D අපරන්ත
(v) ධර්මරක්ෂිත — E වනවාස

(1) ACEBD (2) ADCEB (3) AECDB (4) ADCBE (5) ABECD (..........)

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

21. පැරණි ධාන්‍යාගාරයක නටබුන් හමුවන ඉන්දු නිම්න නගරය කුමක් ද?
(1) රූපාර් (2) මොහෙන්දෝජාරෝ (3) ලෝතාල්
(4) හරප්පා (5) කලිබංගන් (..........)

22. අකිරියවාදය ව්‍යාප්ත කිරීමෙහි ලා මුල්වූයේ කවරෙක් ද?
(1) නිගණ්ඨනාථපුත්ත (2) පූර්ණ කාශ්‍යප (3) අජිත කේශකම්බල
(4) පකුධකච්ඡායන (5) මක්ඛලී ඝෝෂාල (..........)

23. නන්ද වංශයේ අන්තිම පාලකයා කවුරුන් ද?
(1) ධනනන්ද (2) උදායින් (3) වාසුදේව
(4) නන්දිවර්ධන (5) මහාපද්ම (..........)

24. හරප්පා සභ්‍යත්වයෙන් ලැබුණු සතුන් පිරිවරා හිඳ සිටින, මුහුණු තුනකින් යුත් හිස් පළඳනාවක් පැලඳී, පිරිමි දේවරූප මුද්‍රාව හඳුනාගෙන ඇත්තේ කවර දෙවියෙකු ලෙස ද?
(1) විෂ්ණු (2) වරුණ (3) ශිව
(4) ඉන්ද්‍ර (5) යම (..........)

25. ඍග් වෛදික ආර්යයන් සිය ප්‍රධාන දෙවියා වශයෙන් වන්දනාමාන කරන ලද්දේ,
(1) අග්නි (2) වරුණ (3) ඉන්ද්‍ර
(4) බ්‍රහස්පති (5) සෝම (..........)

- **අංක 26 සිට 30 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාල මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය වරහන් තුළ ලියන්න.**

26. **ඍග් වෛදික යුගය**
(1) වෛදික වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය වුයේ කෘෂිකර්මයයි.
(2) වෛදික සමාජය තවමත් ගෝත්‍රික අවධියේ පැවැතිනි.
(3) සමාජය උපත පදනම් කරගෙන වර්ණ හතරකට බෙදී තිබිණ.
(4) කාන්තාවට සමාජයේ වැදගත් තත්ත්වයක් හිමි විය.
(5) ප්‍රධාන වෛදික දෙවිවරුන් වුයේ අග්නි, ඉන්ද්‍ර, සූර්ය හා වරුණ ය. (..........)

27. **සංගම් සාහිත්‍යය**
(1) ක්‍රි.ව. පළමුවන සියවසේ සිට හතරවන සියවස දක්වා කාලය තුළ ස්ථාන තුනක දී හා අවස්ථා තුනක දී සංගම් සාහිත්‍ය ලියැවී ඇත.
(2) සංගම් සාහිත්‍ය ලියවුයේ පාණ්ඩ්‍ය රජුන් ගේ අනුග්‍රහය යටතේ ය.
(3) සංගම් සාහිත්‍ය දළ වශයෙන් කාණ්ඩ දහයකට බෙදනු ලැබේ.
(4) සංගම් යන වචනයේ එක් අර්ථයක් නම් කවීන්ගේ සමුළුව යන්න ය.
(5) රාජ්‍යත්වය, දෙමළ භාෂාව හා සමාජීය වර්ධනය පිළිබඳ තොරතුරු සංගම් සාහිත්‍යයෙන් හෙළි වේ. (..........)

28. **ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික විශ්වාස**
(1) මව් දෙවඟන වැඳීම.
(2) ශිව දෙවියන් පශුපති ලෙස වන්දනය කිරීම.
(3) ජලය ශුද්ධ වස්තුවක් ලෙස වන්දනය කිරීම.
(4) මිනිසුන් බිලිදීම.
(5) වෘක්ෂ වන්දනය (..........)

29. **වර්ණාශ්‍රම ධර්ම**
(1) ශුද්‍රයන්ට ද්විජ තත්ත්වයට පැමිණීමට ඉඩ සැලසී තිබිණ.
(2) උපනයනයෙන් පසු කෙනෙකු ද්විජ තත්ත්වයට පත් වේ.
(3) ඉහළ වර්ණ තුනට අයත් අයට පමණක් වේදය ඉගෙනගත හැකි ය.
(4) පූර්ව වෛදික යුගයේ අවසානය වනවිට බ්‍රාහ්මණයින් ඉහළ ම වර්ණය ලෙස පිළිගැණින.
(5) හින්දු ජනප්‍රවාද අනුව වර්ණ හතර උත්පාදනය වුයේ ප්‍රජාපතී දෙවියන්ගෙනි. (..........)

30. **මගධ රාජ්‍යය**
(1) ක්‍රි.පු. සවැනි සියවසේ දී මගධය සොළොස් මහා ජනපද අතුරෙන් එකක් විය.
(2) බිම්බිසාර රජු විසින් අංග ජනපදය යටත් කිරීමත් සමග මගධ රාජ්‍යයේ උන්නතිය ආරම්භ විය.
(3) කලාපයේ දේශපාලන නායකත්වයට මගධය පත් වුයේ මහජනපද හතරක් අතර වූ සටන්වලින් ජය ගැනීමෙනි.
(4) මෞර්යයන්ට පෙර මගධය හර්යංක, සිසුනාගල සහ නන්ද යන රාජවංශ විසින් පාලනය කරන ලදී.
(5) මගධයේ අගනුවර ලෙස පාටලීපුත්‍රය තෝරා ගත්තේ මෞර්ය වංශය බලයට පත් වීමෙන් අනතුරුව ය (..........)

- **අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A,B,C සහ D යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කිහිපයක් නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝර,**

  A **සහ** B **පමණක් නිවැරදි නම්** **1 ද**
  B **සහ** C **පමණක් නිවැරදි නම්** **2 ද**
  C **සහ** D **පමණක් නිවැරදි නම්** **3 ද**
  A **සහ** C **පමණක් නිවැරදි නම්** **4 ද**
  **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් 5 ද වරහන් තුළ ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදිය. | (B) සහ (C) පමණක් නිවැරදිය. | (C) සහ (D) පමණක් නිවැරදිය. | (A) සහ (C) පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

31. **ඩෙකාන් සානුව**

(A) ඩෙකාන් සානුව වින්ධ්‍යා සිට කන්‍යාකුමාරි දක්වාත් බටහිර සාට්ස් සිට නැගෙනහිර සාට්ස් දක්වාත් විහිද පවතී.

(B) වින්ධ්‍යා වැටිය නිසා ඩෙකානය සදාකාලිකව දේශපාලන වශයෙන් උතුරින් වෙන්ව පැවතුනි.

(C) මහානදී, ගෝදාවරී, කෘෂ්ණ, තුංගබද්‍රා සහ කාවේරි යන ගංගා ඩෙකාන් සානුව ඔස්සේ ගලා බසී.

(D) මුස්ලිම්වරු ඉන්දියාව ආක්‍රමණය කළ අවධියේ දී රාජ්පුත් වැනි සටන්කාමී ගෝත්‍ර ඩෙකානයේ බලවත් වුහ. (..........)

32. **හිමාලයා කඳුවැටිය**

(A) විදේශ ආක්‍රමණයන්ට එරෙහි ස්වාභාවික බාධකයක් ලෙස හිමාලයා කඳුවැටිය ක්‍රියාත්මක විය.

(B) එසේ වුවද වයඹ දිග කපොලු හරහා ආක්‍රමණිකයන්ට ඉන්දියාවට ඇතුළු වීමට හැකි විය.

(C) ආසියාවේ උතුරේ සෙසු ප්‍රදේශවලින් ඉන්දියාව වෙන්කිරීමට හිමාලයා කඳුවැටිය සමත් විය.

(D) මෙම වෙන්වීම හේතුකොටගෙන ඉන්දියාවට ආවේණික වූ සභ්‍යත්වයක් හා ශිෂ්ටාචාරයක් වර්ධනය විය. (..........)

33. **මෞර්යයෝ**

(A) ඉන්දියාවේ ප්‍රථම අධිරාජ්‍ය නිර්මාපකයින් ලෙස සැලකෙන්නේ මෞර්ය වංශිකයෝ ය.

(B) මෞර්යය අධිරාජ්‍ය බිඳවැටුණේ විදේශ ආක්‍රමණ නිසා ය.

(C) මෞර්යයෝ උතුරු ඉන්දියාවට ශක්තිමත් පාලනයක් හඳුන්වා දුන්හ.

(D) මෞර්ය පාලකයන් යටතේ මහායාන බුද්ධාගම ජනප්‍රිය ව පැවතිණි. (..........)

34. **මෙගස්තිනිස්**

(A) මෙගස්තිනිස් වනාහි චන්ද්‍රගුප්ත මෞර්ය රාජ සභාවේ ප්‍රථම ග්‍රීක තානාපතිවරයාය.

(B) ඉන්දියාවෙන් පිටත්ව යාමට පෙර ඇලෙක්සැන්ඩර් විසින් ඔහු පාටලීපුත්‍ර වෙත යවන ලදී.

(C) මෙගස්තිනිස් ඉන්ඩිකා ග්‍රන්ථය ඉන්දියානුවන් ජීවත් වූ ආකාරය පිළිබඳ තොරතුරු ලබාදේ.

(D) ඇලෙක්සැන්ඩර් හා චන්ද්‍රගුප්ත ගිවිසුමකට ගෙන ඒමට මෙගස්තිනිස් සමත් විය. (..........)

35. **ප්‍රසේනජිත් කෝසල**

(A) ඔහුගේ රාජධානියේ අගනුවර වුයේ ශ්‍රාවස්තියයි.

(B) ඔහු තම සහෝදරිය මගධයේ රජ වූ බිම්බිසාරට විවාහ කර දුන්නේ ය.

(C) ප්‍රසේනජිත් කෝසල සටනකින් මරා දැමීමෙන් අනතුරුව ඔහුගේ පුත්‍ර විඩූඩභ රජ විය.

(D) නමුත් අජාසත්ත රජු විසින් ඔහු පළවා හැර කෝසලය මගධයේ කොටසක් බවට පත්කර ගන්නා ලදී. (..........)

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවේ දැක්වෙන 1,2,3,4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

| | පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36 | ඉන්දියානුවන්ගේ පැරණිතම ආගමික සාහිත්‍යය ඍග් වේදයයි. | වෛදික ආගම මූලික වශයෙන් ආකාශය හා ස්වාභාවික වස්තූන් හා සම්බන්ධ දේවිවරුන් මූලික වූවකි. | (..........) |
| 37 | ෆාහියන් නමැති චීන භික්ෂුව ගොඩබිම ඔස්සේ ඉන්දියාවට පැමිණියේ දෙවන චන්ද්‍රගුප්ත සමයේ දී ය. | උන්වහන්සේ ආපසු චීනයට ගියේ මුහුදු මාර්ගය ඔස්සේ ය. | (..........) |
| 38. | කාලිංගයේ චේත රාජවංශයේ ඛරවේලගේ කාර්ය සාපලා‍ය පිළිබඳ හත්ථිගුම්පා සෙල්ලිපියෙන් විස්තර කෙරේ. | ඛාරවේලගේ මරණයෙන් පසු කාලිංග අශෝක රජු විසින් යටත් කර ගන්නා ලදී. | (..........) |
| 39. | වජ්ජි සමූහාණ්ඩුව ප්‍රධාන ගෝත්‍ර හතරකින් සමන්විත විය. | වජ්ජි සමූහාණ්ඩුව ක්‍රි.පූ. හයවන සියවසේ දී ආර්යාවර්තයේ බලවත්ම රාජ්‍ය විය. | (..........) |
| 40. | අශෝක අධිරාජයා බුද්ධාගම ඉන්දියාවේ රාජ්‍ය ආගම කරවී ය. | ඔහු ක්‍රි.පූ. 252 දී පාටලීපුත්‍රයෙහි ධර්ම සංගායනාවක් පවත්වා බුද්ධාගම ව්‍යාප්ත කිරීම සඳහා ධර්මදූතයන් යැවී ය. | (..........) |